පලාගල ප්‍රාදේශීය සභාව
අනුරාධපුර දිස්ත්‍රික්කය
----------------------------

01. මූල්‍ය ප්‍රකාශන
------------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
----------------------------------

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 පෙබරවාරි 08 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 ජූලි 22 දිනද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 සැප්තැම්බර් 04 දිනද සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය
--------------------------------

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට පලාගල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම
---------------------------------------------

(අ) ගිණුම්කරණ අඩුපාඩු
----------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂයේ පොලී ආදායම් රු.663,452 ක් මූල්‍ය ප්‍රකාශනවල රු.551,865 ක් ලෙස දක්වා තිබීම නිසා රු.111,587 ක් අඩුවෙන් දක්වා තිබුණි. | වර්ෂයට අදාල නිවැරදි ආදායම හඳුනාගත යුතුවේ. | පිළිගනිමි. |
| (ii) | සමාලෝචිත වර්ෂයේ වාහන සහ ගොඩනැගිලිවල නවීකරණයන් සහ වැඩිදියුණු කිරීමේ වියදම් රු.341,451 ක් ප්‍රාග්ධනගත කර නොතිබුණි. | ප්‍රාග්ධන වියදම් මූල්‍ය ප්‍රකාශනවල නිවැරදිව දැක්විය යුතුවේ. | පිළිගනිමි. |

(ආ) විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම
-----------------------------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වටිනාකම රු.19,585,219 ක් වූ ගිණුම් විෂයයන් 03 කට අදාලව පිළිගත හැකි සාක්ෂි ඉදිරිපත් නොකෙරුණි. | මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළයුතු වේ. | පිළිගනිමි |

1.4 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම.

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | 2018 අංක 19 දරන විගණන පනතේ 16(2) උපවගන්තිය | වාර්ෂික කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කර නොතිබුණි. | කාර්යසාධන වාර්තාව අවශ්‍ය තොරතුරු ඇතුළත් වන ලෙස වෙනම ඉදිරිපත් කළයුතු වේ. | පිළිගනිමි |
| (ආ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 161 සහ 162 | හඳුන්වාදී ඇති ආකෘති ප්‍රකාර මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර නොතිබුණි. | රීති ප්‍රකාරව අදාල ආකෘතියෙන් ඉදිරිපත් කළ යුතු වේ. | පිළිගනිමි |
| (ඇ) | 2006 නොවැම්බර් 14දිනැති අංක PL 07/01/53 දරන පළාත් පාලන ප්‍රතිසංස්කරණ චක්‍රලේඛ | | | |
| | i. අංක 09 | සුසාන භූමි ලේඛන නඩත්තු කිරීම, ප්‍රකාශයට පත්කිරීම හා තාප්ප වැටවල් යොදා ආරක්ෂා කිරීමට කටයුතු කර නොතිබුණි. | චක්‍රලේඛය අනුව කටයුතු කළ යුතු වේ. | සුසාන භූමි ප්‍රාදේශීය ලේකම් විසින් සභාව වෙත පවරා දී නොමැත. ප්‍රාදේශීය ලේකම්තුමා සමඟ සාකච්ඡා කර අදාල මරණාධාර සමිති එක්ව ආරක්ෂක වැටවල් යෙදීමේ වැඩපිළිවෙලක් යොදමි. |
| | ii. අංක 06.2.2(iii) | අඛණ්ඩව ක්‍රියාත්මක වන මාර්ග නඩත්තු ක්‍රමයක් අනුගමනය කර නොතිබුණි. | චක්‍රලේඛය අනුව කටයුතු කළ යුතු වේ. | නඩත්තුව සඳහා ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වැඩසටහන් ඇතුළත් වැඩ පිළිවෙලක් සකසා ඇත. |
| | | සභාවට අයත් මාර්ග ගැසට් කර නොතිබුණු අතර ගෙනයා හැකි උපරිම බර ප්‍රදර්ශනය කර නොතිබුණි. | චක්‍රලේඛය අනුව කටයුතු කළ යුතු වේ. | මාර්ග ගැසට් කිරීමට කටයුතු යොදන අතර ගෙන යා හැකි උපරිම බර ප්‍රදර්ශනය කිරීමට කටයුතු යොදමි. |

| | | | | |
|---|---|---|---|---|
| (ඈ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 1645 | සභාවේ වාහනවලට අදාළ මාසික ධාවන සටහන් සහ සාරාංශ ඊළඟ මාසයේ 15 වන දිනට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | මුදල් රෙගුලාසි අනුව කටයුතු කළයුතු වේ. | ඉදිරියේදී එවීමට කටයුතු යොදමි. |
| (ඉ) | 2009 අප්‍රේල් 16 දිනැති 09/2009 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | පැමිණීම හා පිටවීම සනාථ කිරීම සඳහා ඇඟිලි සළකුණු යන්ත්‍ර භාවිතා කර නොතිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | ඇඟිලි සලකුණු යන්ත්‍රයක් මිලදීගෙන ඇති අතර එය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කටයුතු යොදා ඇත. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම් ඉක්මවූ ආදායම රු.3,810,858 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.5,870,343 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කල ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම් ,බිල්කල ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2019 | | | | 2018 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කල ආදායම | රැස්කල ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කල ආදායම | රැස්කල ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 1,270,000 | 1,420,560 | 829,110 | 659,050 | 1,180,000 | 1,439,560 | 1,439,560 | 67,600 |
| කුලී | 3,094,500 | 9,595,811 | 9,019,661 | 639,750 | 2,192,000 | 1,750,830 | 1,880,496 | 63,600 |
| බලපත්‍ර ගාස්තු | 300,150 | 241,535 | 241,535 | - | 310,500 | 342,430 | 342,430 | - |
| වෙනත් ආදායම් | 6,870,500 | 15,183,599 | 18,928,536 | 5,500,075 | 6,902,300 | 8,836,092 | 15,592,296 | 9,245,012 |
| එකතුව | 11,535,150 | 26,441,505 | 29,018,842 | 6,798,875 | 10,584,800 | 12,368,912 | 19,254,782 | 9,376,212 |

2.2.2 උසාවි දඩ හා මුද්දර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගේ සහ අනෙකුත් බලධාරීන්ගෙන් 2019 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබුණු උසාවි දඩ රු.5,410,375 ක් හා මුද්දර ගාස්තු රු.89,700 ක් විය. | මුද්දර ගාස්තු හා උසාවි දඩ නිරවුල් කර ගැනීමට කටයුතු කළයුතු වේ. | හිඟ උසාවි දඩ වූ රු.5,410,375 න් රු.4,000,000 අයකිරීමට කටයුතු කර ඇත. ඉතිරි වූ මුද්දර හා උසාවි දඩ අයකිරීමට කටයුතු යොදා ඇත. |

03. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්ය සාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය , පහසුව හා සුභ සාධනය යන සභාව විසින් ඉටුකල යුතුව තිබුණු කර්තව්‍යන් ඉටු කිරීම පිළිබඳව වූ නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

(අ) අතුරු ව්‍යවස්ථා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ප්‍රාදේශීය සභා පනතේ 126 වන වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 28 ක් ඉටුකිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතු නමුත් 2019 දෙසැම්බර් 31 දිනට අදාල කාරණා සම්බන්ධව අතුරු ව්‍යවස්ථා පනවා නොතිබුණි. | අතුරු ව්‍යවස්ථා පැනවීමට කටයුතු කළයුතු වේ. | විෂය භාර ඇමතිතුමා විසින් ඉදිරිපත් කරන ලද සියළු අතුරු ව්‍යවස්ථා වැලදගෙන ඇති අතර අවශ්‍යතාව මත අතුරු ව්‍යවස්ථා පනවා ගැනීමට කටයුතු කරමි. |

(ආ) පාරිසරික ගැටළු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2017 සැප්තැම්බර් 01 දිනැති අංක 2034/36 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය අනුව ප්ලාස්ටික් අඩංගු කසල එළිමහනේ පිළිස්සීම නොකළ යුතු වුවත් සභාව විසින් එකතුවන සියළුම කසල ස්ථාන දෙකකදී වරින්වර පිළිස්සීම සිදුකර තිබුණි. | 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතට අනුව කටයුතු කළයුතු වේ. | සභාව බැහැර කරන පොලිතින් හා අනෙකුත් කසල ආහාරයට ගැනීමට නිතරම වන සතුන් පැමිණීම නිසා එම සතුන්ගේ පැවැත්මට තර්ජනයක්ව පැවතුණු බව අනාවරණය විය. |

(ඇ) තිරසර සංවර්ධන ඉලක්ක

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| එක්සත් ජාතීන්ගේ සංවිධානයේ තිරසාර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් වූ 2030 න්‍යායපත්‍රයේ අරමුණු 06 ක් හඳුනාගෙන තිබුණද එම ඉලක්ක සම්පූර්ණ කිරීම පිළිබඳව අනාවරණය නොවීය. | මෙම අරමුණු හා ඉලක්ක හඳුනාගෙන ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පියවර ගත යුතුවේ. | තිරසර සංවර්ධන අරමුණු අදාළ කාල සීමාව තුලදී සම්පූර්ණ කිරීමට අවශ්‍ය සැලසුම් යොදා ඇත. |

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2018 හා 2019 වර්ෂවල මෝටර් ග්‍රේඩර් යන්ත්‍රය හා පස්තලන යන්ත්‍රය කුලියට දීම වෙනුවෙන් පුද්ගලයන් 20 දෙනෙකුගෙන් අයවිය යුතු රු.639,750 ක් අයකර ගෙන නොතිබුණි. | ලැබිය යුතු ගිණුම් ශේෂ අයකර ගැනීමට කටයුතු කළයුතු වේ. | හිඟ මෝටර් ග්‍රේඩර් කුලී වූ රු.639,750 න් රු. 376,650 ක් අයකරගෙන ඇති අතර ඉතිරි හිඟ මුදල් අයකිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇත. |
| (ආ) | 2016 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා ගෙවිය යුතු විගණන ගාස්තු රු.388,070 ක් නිරවුල් කර නොතිබුණි. | ගෙවිය යුතු ගිණුම් ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළයුතු වේ. | සාභාව සතු අරමුදල් ප්‍රමාණය අඩු මට්ටමක පැවති බැවින් සභාවේ අරමුදල් කළමනාකරණය කිරීමට සිදු වී ඇත. මූල්‍ය ශක්‍යතාව මත ඉදිරියේදී හිඟ මුදල් ගෙවීමට කටයුතු යොදමි. |

3.3 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පූර්ව වර්ෂ 03 කට පෙර කාලයක සිට අය නොවෙමින් පවතින නිලධාරීන් හතර දෙනෙකුගේ සේවක ණය රු.304,339 ක් විය. | සේවක ණය අයකර ගැනීමට කටයුතු කළයුතු වේ. | එක් නිලධාරියෙකු මියගොස් ඇති අතර තවත් නිලධාරියෙකුගේ ලිපිගොනු අස්ථානගත වී ඇත. අනෙක් නිලධාරියාගේ ඇපකරු මගින් අයකර ගැනීමට කටයුතු කර ඇත. |

3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | පස් තලන යන්ත්‍රය මීටර් පැය 336.5 ධාවනය කර තිබුණද අදාළ ආදායම් ලේඛනයේ වැඩකල පැය ගණන 294 ලෙස දක්වා තිබුණු බැවින් රු.85,000 ක ආදායමක් අයවිය යුතු මීටර් පැය 42.5 ක් ධාවනය කිරීම සම්බන්ධව තොරතුරු නොතිබුණි. | ආදායම් ලේඛනය සමඟ සැසඳී තිබිය යුතු වේ. | පස් තලන යන්ත්‍රය භාවිතා කරන ලද පැය ගණන මාර්ග සතිය සඳහා භාවිතා කරන ලද්දක් වූ බවත් ඉදිරියේදී එවැනි ගැටළු ඇති නොවීමටත් අවශ්‍ය කටයුතු සැලැස්වීමට කටයුතු යොදමි. |
| (ආ) | මෝටර් ග්‍රේඩර් යන්ත්‍රය මීටර් පැය 449.2 ක් ධාවනය කර තිබුණද අදාළ ආදායම් ලේඛනයේ වැඩකල පැය ගණන 375.30 ක් ලෙස දක්වා තිබුණි. ඒ අනුව රු.369,500 ක ආදායමක් අයවිය යුතු මීටර් පැය 73.9 ක තොරතුරු නොතිබුණි. | යන්ත්‍රයේ මීටර් පැය ගණන ආදායම් ලේඛන සමඟ සැසඳී තිබිය යුතුවේ. | මෝටර් ග්‍රේඩර් යන්ත්‍රය භාවිතා කරන ලද පැය ගණන මාර්ග සතිය සඳහා භාවිතා කරන ලද්දක් වූ බවත් ඉදිරියේදී එවැනි ගැටළු ඇති නොවීමටත් අවශ්‍ය කටයුතු සැලැස්වීමට කටයුතු යොදමි. |

3.5 මතභේදයට තුඩුදුන් ගණුදෙනු

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ත්‍රීරෝද රථයක් මිලදී ගැනීමේදී 2018/2019 නිෂ්පාදන වර්ෂයේ ත්‍රීරෝද රථයක මිලට, 2016 වර්ෂයේ නිෂ්පාදිත ත්‍රීරෝද රථයක් මිලට ගෙන තිබුණි. | ප්‍රසම්පාදන කාර්යය නිවැරදිව සිදු කළයුතු වේ. | ත්‍රී රෝද රථය මිලදී ගැනීම පිරිවිතරයන්ට අනුකූලව සිදුකර ඇති අතර , ත්‍රී රෝද රථය 2016 නිෂ්පාදිත බව තහවුරු වූයේ ලියාපදිංචි සහතිකය ලද පසුවය එහිදී සිදු වූ අලාභය අදාල ආයතනයෙන් අයකර ගැනීමට කටයුතු කර ඇත. |
| (ආ) | රාජ්‍ය ප්‍රතිපත්තියට අනුව අළුත්ම වාහන නිෂ්පාදකයාගෙන් හෝ බලයලත් නියෝජිතයාගෙන් මිලට ගතයුතු වුවද 1995 නිෂ්පාදිත පැරණි පරිහරණය කරන ලද ත්‍රීරෝද රථයක් රු.248,000 ක් ගෙවා මිලදී ගෙන තිබුණි. | රාජ්‍ය ප්‍රතිපත්තීන්වලට අනුව මිලදී ගැනීම් සිදුකළ යුතු වේ. | ව්‍යාපාරික ලාභය මත නව ත්‍රී රෝද රථයක් මිලදී ගැනීමට කාලයක් ගතවන බැවින් හා අඛණ්ඩව නිෂ්පාදන කටයුතු සිදුකිරීම හේතුකොටගෙන පැරණි ත්‍රී රෝද රථයක් මිලදී ගැනීමට සිදුවිය. |

3.6 වත්කම් කළමනාකරණය

3.6.1 වත්කම් ලේඛනගත නොකිරීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභා පරිශ්‍රයේ ඇති පැරණි L 200 වර්ගයේ කැබ් රථය ලේඛනගත කර නොතිබුණි. | සභාව විසින් භාවිතා කරන සියළුම වත්කම් ගිණුම්ගත කිරීමට කටයුතු කළයුතු වේ. | මෙම රථය මුදල් අමාත්‍යාංශයට අයත් වාහනයක් වන අතර ශ්‍රී ලංකා යුද හමුදාව මගින් රැගෙන ගොස් නැවත රැගෙන ආ වුවක් වේ. මෙහි ඵලදායී ජීවිත කාලය ද ඉකුත් වී ඇත. මෙය අපහරණය කිරීම සඳහා පළාත් පාලන දෙපාර්තමේන්තුවට දැනුම් දී ඇත. |

3.6.2 වත්කම්වලින් ලැබිය යුතු ආදායම් ලබානොගැනීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාවට අයත් ආඬියාගල වෙළඳ සංකීර්ණයේ ඉහළ මහලේ කඩ කාමර 05 ක් සමාලෝචිත වර්ෂයට බදු දී නොතිබුණි. | බදු දීමට කටයුතු කර ආදායම් අයකර ගත යුතු වේ. | බදු දීමට කටයුතු කරමින් පවතී. |

3.6.3 පවරා නොගත් වත්කම්

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සභාව විසින් භාවිතා කරනු ලබන රු.1,800,000 ක් වටිනා මෝටර් රථ හා වටිනාකම හඳුනාගත නොහැකි යතුරු පැදිය හා ට්‍රේලර් 02 ක අයිතිය සභාවට පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | සභාව විසින් භාවිතා කරනු ලබන සියළුම වත්කම්වල අයිතිය පවරා ගැනීමට කටයුතු කළයුතු වේ. | මෙම රථය පළාත් පාලන දෙපාර්තමේන්තුවට ලද්දක් වූ අතර එය පවරා ගැනීමට කටයුතු කරමි. යතුරු පැදිය ෆැන් ශ්‍රී ලංකා ව්‍යාපෘතිය මගින් ලබා දී ඇති අතර ට්‍රේලර් 02 හා මෙම මෝටර් රථයේ අයිතිය සම්බන්ධ තොරතුරු නොමැති බැවින් පවරා ගත නොහැකි වී ඇත. |
| (ආ) | සභාව විසින් පරිහරණය කරනු ලබන රු.10,051,000 වටිනා අක්කර 52 රූඩ් 02 ක ප්‍රමාණයකින් යුතු ඉඩම් සභාවේ නමට පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | සභාව විසින් භාවිතා කරනු ලබන සියළුම වත්කම්වල අයිතිය පවරා ගැනීමට කටයුතු කළයුතු වේ. | පවරා ගැනීමට කටයුතු කරමි. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | සභාව සතු වටිනාකම රු.490,000 ක් වූ ට්‍රැක්ටර් ට්‍රේලර් දෙකක් සහ වතුර බවුසර් දෙකක් ලියාපදිංචි නොකර ධාවනය කරමින් පැවතුණි. | වාහන ලියාපදිංචි කර ධාවනයේ යෙදවීමට කටයුතු කළයුතු වේ. | ලියාපදිංචි කිරීමට අවශ්‍ය තොරතුරු නොමැති බැවින් පවරා ගත නොහැකි වී ඇත. |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේ ඔක්තෝබර් 29 දින රු.248,000 කට මිලදීගත් පැරණි ත්‍රීරෝද රථය ලියාපදිංචි අයිතිය පවරාගැනීමට කටයුතු කර නොතිබුණි. | අයිතිය පවරා ගැනීමට කටයුතු කළයුතු වේ. | ලියාපදිංචි කිරීමට කටයුතු කරමි. |

3.6.4 නිශ්ක්‍රීය / ඌන උපයෝජිත වත්කම්

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | වටිනාකම රු.1,542,228 ක් වූ ගොඩනැඟිල්ලක් සහ වටිනාකම හඳුනාගත නොහැකි ගොඩනැගිලි 02 ක් නිශ්කාර්යව පැවතුණි. | සභාව සතු සියළුම වත්කම් ප්‍රයෝජනවත් කාර්යයන් සඳහා යොදා ගත යුතු වේ. | පුබ්බෝගම වැසිකිලි පද්ධතියට මහජනතාවගේ පැමිණීම අවම මට්ටමක පවතින අතර එක් ගොඩනැගිල්ලක් පිළිසරු ව්‍යාපෘතියට යොදාගැනීමට අපේක්ෂිත ය. ආඩියාගල වැසිකිලි පද්ධතියට ජලය ලබාගැනීමට කටයුතු කර ඇත. |
| (ආ) | රු.230,600 ක් වටිනා සහල් පිටි මගින් බේකරි නිෂ්පාදන සිදු කරනු ලබන යන්ත්‍රසූත්‍ර 2014 වර්ෂයේ සිට නිශ්කාර්යව පැවතුණි. | සභාව සතු සියළුම වත්කම් ප්‍රයෝජනවත් කාර්යයන් සඳහා යොදා ගත යුතු වේ. | ප්‍රයෝජනයට ගත හැකි යන්ත්‍ර හා උපකරණ නව බේකරියට යොදා ගැනීමටත් ප්‍රයෝජනයට ගත නොහැකි යන්ත්‍ර හා උපකරණ අපහරණය කිරීමටත් කටයුතු කරමි. |

3.7 හඳුනාගත් පාඩු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව විසින් පවත්වාගෙන යන බේකරිය හා අවන්හලින් 2019 වර්ෂය තුළදී රු.398,568 ක පාඩුවක් සිදුවී තිබුණි. | පාඩු නොවන ආකාරයට මහජන සේවා ව්‍යාපෘති පවත්වා ගත යුතුවේ. | මනා කළමණාකාරීත්වයක් තුලින් ඉදිරියේදී මෙම අලාභය අවම කිරීමට කටයුතු කරමි. |

04. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| උතුරු මැද පළාත් පාලන කොමසාරිස්ගේ 2015 මාර්තු 18 දිනැති අංක 04/2015 දරන චක්‍රලේඛයේ 06 ඡේදය ප්‍රකාරව සෑජුවම වගකියනු ලබන අභ්‍යන්තර විගණන නිලධාරියෙකු පත්කර වාර්තා ලබාගෙන නොතිබුණි. | චක්‍රලේඛය අනුව කටයුතු කළයුතු වේ. | ඉදිරියේදී සුදුසු නිලධාරියකු පත්කර අවශ්‍ය වාර්තා ලබාදීමට කටයුතු කරමි. |